# අනගාරික ධර්මපාලතුමා සහ වර්තමාන කියවීම

**පූජ්‍ය මහාචාර්ය අගලකඩ සිරිසුමන**
සිංහල අධ්‍යයනාංශය
කොළඹ විශ්වවිද්‍යාලය
*sirisumanathero@gmail.com*

අනගාරික ධර්මපාලතුමා සහ වර්තමාන කියවීම පිළිබඳ ගවේෂණය කිරීමේදී තේමා පහක් යටතේ කරුණු ගෙනහැර දක්විය හැකිය. එහිදී පළමු කරුණ වන්නේ අනගාරික ධර්මපාල දැක් වූ නූතන සමාජ නායකත්වයට කවර ආකාරයෙන් සම්බන්ධ කර ගත හැකිද යන්නයි. දෙවැනි කරුණ වන්නේ අනගාරික ධර්මපාලතුමාගේ දර්ශනය තුළ පංති සමාජය සකස්විය යුත්තේ කෙසේද යන්නයි. තුන්වන කරුණ වන්නේ ආහාර සුරක්ෂිතතාව හා පරිසර හිතවාදී සෞඛ්‍ය සම්පන්න මානව සමාජයක් උදෙසා ධර්මපාල දැක්වූ කෙසේ සකස් විය යුතුද යන්නයි. දේශීය අධ්‍යාපන දැක්මක් උදෙසා ධර්මාපලතුමන්ගේ දර්ශනය කවර ආකාරයෙන් භාවිත කළ යුතුද යන්න සිව්වන කරුණ ලෙස දැක්විය හැකිය. පස්වන කරුණ වන්නේ දේශීය සංස්කෘතික පුනර්ජීවනයක් උදෙසා ධර්මපාලතුමන්ගේ දැක්ම කුමන ආකාරයෙන් අප නූතනයට යොදා ගත යුතුද යන්නයි.

පළමුව අනගාරික ධර්මපාලතුමන්ගේ දර්ශනය නූතන සමාජ නායකත්වයක් ගොඩනගා ගැනීම සඳහන් කවර ආකාරයෙන් සම්බන්ධ කර ගත යුතුද යන්න පිළිබඳ අවධානය යොමු කළ යුතු ය. ධර්මපාලතුමන්ගේ දර්ශනය විමසා බලන කළ සමාජ නායකත්වය ''දේශජ'' භාවයකින් පෝෂණය විය යුතු බව පෙන්වා දෙයි. එනම් ශ්‍රී ලාංකීය නැඹුරුවක් හා ශ්‍රී ලාංකේය සංස්කෘතික වටපිටාවක් තුළින් නායකත්වය ගොඩනගා ගැනීමෙනි. ඇඳුම පවා දේශීයත්වයට ගැළපෙන අයුරින් සකස් කර ගත යුතු බව පෙන්වා දෙයි. ජාතික භාෂාව කෙරෙහි අපට අභිමානයක් තිබිය යුතුය. හෙළ බසෙන් සන්නිවේදනය නිවැරදිව යොදා ගැනීම සම්බන්ධ යටත් විජිත යුගයේ අපට හමුවන හොඳම ආදර්ශය ධර්මපාලතුමන් ය. ධර්මපාලතුමන් භාවිත කළ කර්කෂ වූ රළු වදන් පවා ප්‍රබල සන්නිවේදනයකට හේතු විය. ධර්මපාලතුමා නව නායකත්ව ගුණාංගයන්ගෙන් ලබා දුන් ආදර්ශය ඕනෑම නායකයෙකුට වැදගත් වේ. සෑම කරුණක් පිළිබඳව ප්‍රත්‍යක්ෂ අවබෝධයක් එතුමන්ට විය. බුදුදහම පිළිබඳව බෞද්ධ ආර්ථිකය පිළිබඳ සමාජ ආචාරධර්ම සම්බන්ධයෙන් ධර්මපාල චින්තනය සෑමවිටම තම ජීවිතාවබෝධයෙන් ප්‍රත්‍යක්ෂ කළ ප්‍රකාශන බවට පත්විය. එබැවින් එතුමා නිර්ව්‍යාජව අදහස් පළකර ඇත. සමාජ නායකත්වය ඇතිකර ගන්නා කෙනෙකුට ධර්මපාල චින්තනය වඩාත් වැදගත් වේ.

නායකත්වයට අවශ්‍ය චතුර කථිකත්වය, දේශන රටාව සම්බන්ධ ධර්මපාල කියවීම නූතන සමාජ නායකත්වයට බෙහෙවින් වැදගත් වේ. එතුමා තැනට සුදුසු අයුරින් හැම ශ්‍රාවකයෙකුම

ජීවිතයට යමක් ලැබෙන පරිදි තම දේශන හා අදහස් ඉදිරිපත් කර ඇත. එතුමාගේ නායකත්වය නූතන බාල පරම්පරාවට හා කරුණු පරම්පරාවට බෙහෙවින් මාර්ගෝපදේශකත්වයක් සලසයි. මෙහිදී ඇමරිකානු ජාතික ලෝක ගෝල්ෆ් ශූරයා වූ ටයිගර් ''මගේ ලෝකයේ වීරයා අනගාරික ධර්මපාලතුමා'' බව පවසයි.

මිනිසා ජීවත් විය යුතු ආකාරය ධර්මපාලතුමාගේ ජීවිත දර්ශනයෙන් පෙන්නුම් කරන බව ටයිගාර් විසින් පවසයි. ඔහු වැනි ලෝක ශූරයෙකුට තම නායකත්වය හා වීරත්වය ඇතිකර ගැනීම සඳහා ධර්මපාලතුමා හේතු විය. එනම් ධර්මපාලතුමා නොදකපු, ධර්මපාලතුමාගේ රටට වන සම්බන්ධතාවක් නොමැති ඇමරිකානු ජාතිකයෙකුට ධර්මපාල දැක්ම ජීවාතදර්ශයක් වී ඇත. මේ අනුව ලෝක වීරයන් පවා තමන්ගේ නායකත්වය උදෙසා ධර්මපාල වැනි චරිතයක් නූතනයේ භාවිත කරයි නම් ශ්‍රී ලාංකිකයන් වන අපට සමාජ නායකයෙකු ලෙස එතුමාගේ චින්තනය භාවිතා කළ හැකි බව හඳුනා ගත යුතු ය. නූතන සමාජ නායකත්වය, අනාගත දැක්ම ගොඩනගා ගැනීම සඳහා පරමාදර්ශ සොයා යා යුත්තේ ධර්මපාල චින්තනයෙන් බව අවධාරණය කළ හැකි ය.

දෙවනුව අනගාරික ධර්මපාලතුමන්ගේ දර්ශනය තුළ සංඝ සමාජය සකස් විය යුත්තේ කෙසේද? යන්න සලකා බැලිය යුතුය. නූතන සමාජයේ බොහෝ ප්‍රශ්න විසඳා ගැනීම සඳහා සංඝ සමාජය කවර ආකාරයෙන් කටයුතු කළ යුතු ද යන්න කාලෝචිත ය. සාම්ප්‍රදායික භික්ෂුව ධර්මපාලතුමාගේ දැයි විවේචනයට ලක් විය. එතුමා ප්‍රසිද්ධියේ බියකින් තොරව භික්ෂූන්ගේ වැරදි පෙන්වා දී ඇත. භික්ෂූන් වහන්සේලා තථාගත ධර්මය පිළිබඳ නිවැරදි අවබෝධයක පිහිටා කටයුතු කළ යුතු බවත්, ඒ තුළ නිවැරදිව අනුශාසනා කිරීමේ අවශ්‍යතාවයක් පෙන්වා දී ඇත. ධර්මයෙන් නිවැරදිව අනුශාසනා කරන කල සිංහල බෞද්ධයන්ගේ අභිවෘර්ධිය උදෙසා වෙනස් මඟක් අවශ්‍ය නොවන බව ධර්මපාලතුමා පෙන්වා දී ඇත. අද මෙන් සංකීර්ණ සමාජයකට භික්ෂුවගේ ක්‍රියාකාරීත්වය සම්බන්ධව එවැනි ප්‍රකාශන ඉතාමත් වැදගත් වේ. භික්ෂුව සැමකල්හි ම ජනතාවගේ මුර දේවතාවා හා කල්‍යාණ මිත්‍රයා විය යුතු බව පෙන්වා දෙන අතර, භික්ෂුව තරම් සමාජ නායකත්වයක් ලෝකයේ අන් කවර රටකවත් නොමැති බව එතුමා විශ්වාස කර ඇත. භික්ෂුව තම කාර්යභාරය පිළිබඳ මනා අවබෝධයකින් කටයුතු කරයි නම් සිංහල ජාතියත්, බෞද්ධ සමාජයත්, රටත් ඉතාම උසස් අභිවෘද්ධියකට ගෙන යා හැකි බව පෙන්වා දී ඇත. වර්තමානයට ද එම දැක්ම බෙහෙවින් වැදගත් වේ.

භික්ෂු සමාජයේ පවතින අසමගිතා හා භේද බින්න ධර්මපාලතුමාගේ දැඩි විවේචනයට ලක් විය. නිකාය ලෙස, ගෝත්‍ර ලෙස බෙදී වෙන් වී කටයුතු කිරීමේ දුර්වලතා දැඩි ලෙස විවේචනය කර ඇත. මෙයින් විහාරස්ථාන හා උසස් ආයතනවල ශෝචනීය පිරිහීම සිංහල ජාතියේ පිරිහීමක් ලෙස පෙන්වා දී ඇත. සිංහල ගැමියන්ට නිවැරදි නායකත්වය සලසා දිය

යුත්තේ ගමේ පන්සල බවත්, එබැවින් පන්සල අවිද්‍යාව පතුරුවන තැනක් නොවිය යුතු බවත් පෙන්වා දෙන ධර්මපාලතුමා භික්ෂුව, සම්මා දිට්ඨියෙහි පිහිටා කටයුතු කිරීමේ වැදගත්කම කියා දෙන ලදි. භික්ෂුන් වහන්සේ නමක් සිංහල, දෙමළ, ඉංග්‍රීසි හා හැකි තරම් විදේශ භාෂා දැන සිටිය යුතු බව එතුමා අවධාරණය කළහ. ඒ මගින් එතුමා අපේක්ෂා කළේ, භික්ෂුවකගේ උතුම් මෙහෙවර ගමකට සීමා නොවී ලෝකයට ධර්මය ගෙන යාමේ දූතයන් විය යුතු බවයි. ඒ සඳහා භික්ෂුව හැම විටම සුදුසුකම් ලැබිය යුතු බව පෙන්වා දී ඇත. ලංකාවේ ජාතිය සහ ආගම විශිෂ්ට ලෙස ඉස්මතු කර දැක්වීමේ විශාලතම වගකීම බෞද්ධ භික්ෂුන් වහන්සේට පවතින බව ධර්මපාලතුමා පෙන්වා දී ඇත. එය වර්තමානයට ද වැදගත් වේ.

ධර්මපාලතුමා ආහාර සුරක්ෂිතතාව පරිසර හිතවාදී සෞඛ්‍ය සම්පන්න මානව සමාජයක් ගොඩනගා ගැනීම සම්බන්ධව ද වැදගත් අදහස් පළ කර ඇත. නූතන සමාජය කෘෂි රසායන උවදුරින් පීඩාවට පත් වී ඇත. වසර 50 ක් පුරාවට අවිචාරවත් කෘෂි රසායන මෙවලම් මහ පොළවට ජනිත කරවීම නිසා ශ්‍රී ලාංකික භූමිය නිස්සාරණය වී ඇත. රටවැසියා බරපතල ලෙස බෝ නොවන රෝගයන්ට ගොදුරු වී ඇත. වකුගඩු දියවීමේ රෝගයට මිනිසුන් විශාල ප්‍රමාණයක් ගොදුරු වී අවසන්ය. මෙවන් වටපිටාවකට ස්වභාවික ගොවිතැන් ක්‍රම තුළ පැවති වැදගත්කම ධර්මපාලතුමා පෙන්වා දී ඇත. වත්මන් රජය අවධානය යොමුකරන කෘෂි නාශක ද්‍රව්‍ය පෙන්වීම තහනම් කිරීමත් මිනිසාට අහිතකර රසායන පොහොර වර්ග ආනයනය නතර කිරීමත් බැලූ කල මුල පටන් ධර්මපාල චින්තනයට අනුව කටයුතු කළේ නම් එවැනි පරිශ්‍රමයක් දැරීමට සිදු නොවේ. දේශීය ආහාර නිෂ්පාදනය තුළ ගෙවතු වගාව ශක්තිමත් කර ගැනීම උදෙසා උපදෙස් දුන් ධර්මපාලතුමා අවම වශයෙන් සෑම නිවසකම මිරිස් පැළයක් හෝ වගා කර ගැනීමට ක්‍රියා කළ යුතු බව සඳහන් කරයි. ජනතාවගේ සෞඛ්‍ය සම්පන්න බව ගොඩනගා ගැනීම සඳහා මෙම පරිසර හිතකාමී ගොවිතැන් ක්‍රම සහ ඒ ඔස්සේ ගොඩනැගෙන ආහාර නිෂ්පාදනය කෙරෙහි ධර්මපාලතුමා තුළ දැක්මක් විය. එතුමා ගවමස් කෑමට එරෙහි වූ ප්‍රධාන හේතු දෙකක් ඉදිරිපත් කරන ලදි. එනම් ගවයා අහිංසාවාදී සතෙක් ලෙස හා ගවමස් අනුභව කරන්නා බරපතල රෝගියෙකු වන බවත් ය. මෙම කාරණා දෙක මුල්කර ගනිමින් මුළු මහත් සමාජයම ගවමස් කෑමේ උවදුරින් මුදා ගැනීමට ගත් උත්සාහය වත්මනේ තවත් ඉදිරියට ගෙන යාමට අවශ්‍යව ඇත. මත්පැන් සහ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් එතුමා ගෙන ගිය දැඩි විරෝධය, ජාතිය මොට කරන, ජාතිය කාලකණ්නි කරන මෙම උවදුරින් ලක් වැසියා බේරා ගැනීමට කටයුතු සම්පාදනය කරන ලදි.

දේශීය අධ්‍යාපන දැක්මක් ඇතිකර ගැනීමේ වැදගත්කම ධර්මපාලතුමන් හැම විටම ප්‍රකාශ කළ කරුණක් විය. විශේෂයෙන් එතුමා මිෂනාරී අධ්‍යාපනයට එරෙහිව ප්‍රබල හඬක් නැගීය. එහි ප්‍රතිඵලයක් ලෙස බෞද්ධ අධ්‍යාපන සංකල්ප මීට වසර පනහකට පෙර ලංකාවේ සමාජ ගත කළ හැකි විය. එම බෞද්ධ අධ්‍යාපන සංකල්ප නව දැනුමක උල්පත් බවට පත් විය.

පසුකාලීනව එම සංකල්ප බැහැර කර විජාතික අධ්‍යාපනික සංකල්ප තුරුළු කර ගැනීම නිසා අද දවසේ අධ්‍යාපනය වෙනුවෙන් කරන සුවිසල් ආයෝජනය නිෂ්ඵල ව්‍යායාමයක් බවට පත්ව ඇත. ධර්මපාලතුමා පැරණි භාෂා හා ශාස්ත්‍රීය අධ්‍යාපනය අගය කළ අතරම ජාතක කතා පොත, සද්ධර්මරත්නාවලිය වැනි ග්‍රන්ථවලින් නූතන අධ්‍යාපන සංකල්ප පෝෂණය කර ගැනීමේ වැදගත්කම පෙන්වා දී ඇත. වර්තමාන ඉංග්‍රීසි අධ්‍යාපනය කෙරෙහි දක්වන සැලකිල්ල තරමටම පැරණි භාෂා ශාස්ත්‍ර හා පැරණි සාහිත්‍ය ඉගෙනීමේ අවශ්‍යතාව ද පෙන්වා දෙයි. වෘර්ත්‍යාභිමුක අධ්‍යාපනය වර්තමානයට කෙතරම් වැදගත්ද යන්න ධර්මපාල චින්තනය විමසන කල හඳුනා ගත හැකිය. විශ්වවිද්‍යාල තුළ පවා වෘර්ත්‍යාභිමුක පාඨමාලා කෙරෙහි අවධානය යොමුකර ඇත්තේ අවම වශයෙනි. එබැවින් විශ්වවිද්‍යාල අධ්‍යාපනය හා පාසල් උසස් අධ්‍යාපනය හැම විටම වෘර්ත්‍යාභිමුඛ විය යුතු බව ධර්මපාලතුමන්ගේ දැක්ම විය. විශේෂයෙන් රටක් ජාතියක් ගොඩනැගුමෙහි ලා ඊට මඟ තනන්නන් ගුරුවරුන් විය යුතු බව ප්‍රකාශ කර ඇත. එනිසා ශාස්ත්‍රවන්ත ගුරුවරුන්ගේ ක්‍රියාවලිය ධර්මපාලතුමන්ගේ ඇගයීමට ලක් විය. වත්මන් සමාජය තුළ ශික්‍ෂක පදවිය නුසුදුස්සන් අතට පත්වීම නිසා අධ්‍යාපනයේ පිරිහීමක් දැකිය හැක. එවන් සමාජයකට ධර්මපාලතුමන්ගේ අධ්‍යාපන සංකල්ප ලන් කරලීම බොහෝ සෙයින් වැදගත් වේ. මාතෘ භාෂාවෙන් තම මූලික අධ්‍යාපනය ලබා ගැනීමේ වැදගත්කම පෙන්වා දී ඇත. වර්තමානයේ කිසිදු පාලනයකින් තොරව අන්තර්ජාතික පාසල් වැනි රාජ්‍ය නිර්ණායකින් තොර පෞද්ගලික පාසල් හා ඒවායේ ක්‍රියාත්මක වන අධ්‍යාපනික සංකල්ප හේතුවෙන් දේශීය අධ්‍යාපනයේ බරපතල පිරිහීමක් දැකිය හැක. එම පිරිහීම නැතිකර ගැනීම සඳහා ධර්මපාලතුමන්ගේ කියමන් හා දැක්ම ඉස්මතු කරලීම සියල්ලන්ගේ වගකීමකි.

ධර්මපාලතුමාගේ දැක්ම විදේශාධිපත්‍යයෙන් රට මුදා ගැනීමට මූලික විය. ජාතික සංස්කෘතියෙහි වැදගත්කම පිළිබඳ දේශන පවත්වමින් ජාතිය නගා සිටුවීමෙන් ජාතික සංස්කෘතියක් මෙරට ගොඩනගාලිය හැකි බව එතුමන්ගේ විශ්වාසය විය. ජාතිය නගාසිටුවීමේ ක්‍රියාදාමයට බුදු සමයෙන් මඟ පෙන්වීමක් සලසා ගත හැකි බව පෙන්වා දෙන ධර්මපාලතුමා සිංහල සංස්කෘතික පුනර්ජීවනයක් උදෙසා සිංහල සිරිත් විරිත්වල වැදගත්කම ද පෙන්වා දී ඇත. ජාතික සංස්කෘතියේ වැදගත්ම ලක්‍ෂණය වන සිරිත් විරිත් බුදු සමයෙන් පෝෂණය කර ගැනීම තුළ විශිෂ්ඨ සංස්කෘතියකට උරුමකම් කිව හැකි බව එතුමන්ගේ විශ්වාසය විය. දේශීය කර්මාන්ත රාශියක් එතුමාගේ නායකත්වයෙන් බිහි විය. ඒවාට අවශ්‍ය පුහුණුව විදෙස් රටවල්වලින් ලබා ගැනීමට කටයුතු කළ අතර, ඒ තුළින් රටක සංස්කෘතිය දියුණුවේ වැදගත්ම අංගයක් වන ආර්ථික දියුණුව ගොඩනැගෙන බව විශ්වාස කළේය. ජාතික සංස්කෘතියක් ගොඩනැගීමේ සංස්කෘතිකාංග මිත්‍යාවන් ගෙන් පිරුණක් නොවිය යුතු බව එතුමා විශ්වාස කළේය. අසුභ බව, අසුභ දවස්, අසුභ වෙලාවල්, අසුභ යෝග ඉදිරියට ගෙන වැඩ කල් දැමීම ධර්මපාලතුමාගේ දැඩි විවේචනයට ලක් විය. ශ්‍රී ලාංකීය ජාතිය හැම විටකම සම්මා දිට්ඨික වීමේ වැදගත්කම පෙන්වා දී ඇත. වර්තමානයේ මිනිසා කෙතරම්

මිත්‍යා දෘෂ්ඨික වී ඇත්ද යන්න ලංකාවේ විභාග සංස්කෘතිය දෙස බැලූ කළ අවබෝධ කර ගත හැකිය. උසස් පෙළ, සාමාන්‍ය පෙළ හා ශිෂ්‍යත්ව විභාගය තුළ පෙර නොවූ විරූ මිත්‍යා දෘෂ්ඨික සංකල්ප වෙත අවධානය යොමු වී ඇත. එවැනි වටපිටාවක් තුළ ධර්මපාලතුමාගේ සම්මා දිට්ඨික දැක්ම ජාතික සංස්කෘතියක් ඔසවා තැබීම සඳහා වැදගත් වේ. මෙලෙස ප්‍රධාන කරුණු පහක් ඔස්සේ අනගාරික ධර්මපාල චින්තනය වර්තමාන සමාජ කියවීමකට ලක් කළ හැකිය.

වර්තමකෙයේ ධර්මපාල චින්තනය දරු පරම්පරාවට ඉගැන්වීම වත්මන් අපගේ වගකීමක් ලෙස දැකිය හැකිය. මේ අනුව නූතනයට වැදගත්ම කාරණාවක් ලෙස රෝගී වූ ජාතිය සුවපත් කිරීම සඳහා ධර්මපාල චින්තනය බෙහෙවින් වැදගත් බව සඳහන් කළ හැකිය.